| වෙළඳ සහ අනිකුත් ගෙවිය යුතු දේවල්හි (වැඩිවීම) / අඩුවීම | | 343,355,255 | 1,596,682,786 |
| ව්‍යවස්ථාපිත ගෙවීම්වල (වැඩිවීම) / අඩුවීම | | 210,493,801 | 67,107,049 |
| **මෙහෙයුම්වලින් උත්පාදනය කරන ලද මුදල්** | | (634,540,379) | 367,305,101 |
| මූල්‍ය පිරිවැය ගෙවීම් | 8 | (1,464,871,479) | (412,740,439) |
| පාරිතෝෂිත ගෙවීම් | 19 | (8,283,358) | (5,906,607) |
| මෙහෙයුම් ක්‍රියාකරකම්වලින් ශුද්ධ මුදල් | | (2,107,695,216) | (51,341,945) |
| **ආයෝජන ක්‍රියාකාරකම් හරහා මුදල් ගලාඒම** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ මිළදී ගැනීම | 10 | (288,408,585) | (428,609,736) |
| අස්පෘශ්‍ය වත්කම් මිළදී ගැනීම | 11 | (50,099,999) | (3,410,049) |
| පොළී ලැබීම් | 7 | 100,892,068 | 96,167,991 |
| ස්ථාවර තැන්පතුවල අයෝජනය කිරීම් | 16 | (6,309,198) | (568,016,559) |
| ආයෝජන ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ගැලීම් | | (243,925,715) | (903,868,352) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින්/ මුදල් ගැලීම්** | | | |
| ණය ආපසු ගෙවීම් | 18 | 2,077,007,417 | (649,000,000) |
| රජයෙන් ලැබුණු ප්‍රදානයන් | 20 | 238,987,540 | 381,619,756 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින්/ශුද්ධ මුදල් ගැලීම් | | 2,315,994,957 | (267,380,244) |
| **මුදල් සහ මුදල් සමාන දේවල් ශුද්ධ වැඩිවීම** | | (35,625,972) | (1,222,590,542) |
| **වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ** | | **305,755,402** | **1,528,345,944** |
| **වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ** | 23 | **270,129,430** | **305,755,402** |

**සීමාසහිත ලංකා සතොස**
2019 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1. සංස්ථාපිත තොරතුරු

### 1.1. පොදු තොරතුරු

ලංකා සතොස ලිමිටඩ් යනු ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සහ පවත්වාගෙන යනු ලබන රජය සතු විශාලතම සිල්ලර ව්‍යාපාරික ජාලය වේ. සමාගමේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 27, සතොස මහ ලේකම් ගොඩනැගිල්ල, වොක්ෂෝල් වීදිය, කොළඹ 02 යන ස්ථානයේ පිහිටා ඇත.

### 1.2. ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ ඉක්මනින් විකිණෙන පාරිභෝගික භාණ්ඩ සහ පොදු අනෙකුත් වෙළඳ භාණ්ඩ අලෙවිසැල් දාමයක් තුළින් බෙදාහැරීම යි.

### 1.3. සේවකයින් ගණන

2019 දෙසැම්බර් 31 දිනට සමාගමේ සේවක සංඛ්‍යාව 3,656 ක් විය (2018 දෙසැම්බර් 31 දිනට 3755)

## 2. සුවිශේෂී ගිණුම් ප්‍රතිපත්ති

### 2.1. පිළියෙල කිරීමේ පදනම

ලංකා සතොස ලිමිටඩ් සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති පරිදි SLFRS සහ LKAS වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතවලට අනුකූලව වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත්තේ සේවක ප්‍රතිලාභ බැරකම්වලට හැර ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන ය. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඉදිරිපත් කරනු ලබන්නේ 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව ය.

#### 2.1.1. සංසන්දනාත්මක තොරතුරු

පවත්නා වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වඩාත් හොඳින් ඉදිරිපත් කිරීමට සහ සංසන්දනාත්මක වීමට අනුගතව අවශ්‍ය අවස්ථාවන් වලදී පෙර වර්ෂවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය කිරීම සංශෝධනය කොට ඇත.

#### 2.1.2. නිකුත් කිරීම සඳහා අවසර ලබාදීමේ දිනය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලංකා සතොස ලිමිටඩ් සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම පිණිස 2021 ජූනි මස 23 වෙනි දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ යෝජනා සම්මතයක් මගින් අවසර දෙනු ලැබීය.

## 2.2. සුවිශේෂී ගිණුම්කරණ විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පනයන්

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමනාකාරීත්වයට තීන්දු ගැනීමට, ආදායමේ වාර්තාගත වටිනාකමට බලපානු ලබන ඇස්තමේන්තු සහ උපකල්පන, වියදම්, වත්කම් සහ බැරකම්, සහ අනුගාමී අනාවරණය කිරීම් මෙන්ම අසම්භාව්‍ය බැරකම් සම්බන්ධ අනාවර්ණය කිරීම් සිදුකිරීමට කළමනාකරණයට අවශ්‍ය වේ.

මෙම උපකල්පන සහ ඇස්තමේන්තුවල අවිනිශ්චිත බව අනාගතයේදී වත්කම්වල හෝ බැරකම්වල ධාරණ අගයට ද්‍රව්‍යාත්මක ගැළපීමක් සිදුකිරීමට අවශ්‍ය කරනු ලබන ප්‍රතිඵල විය හැක.

සමාගමේ ගිණුම් ප්‍රතිපත්ති අදාල කරගැනීමේ ක්‍රියාවලියේදී, ඊළඟ මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ බැරකම්වල ධාරණ අගයට ද්‍රව්‍යාත්මක ගැළපීමක් ඇති කිරීමේ සුවිශේෂී අවදානමක් තිබෙන, වාර්තා කරනු ලබන දිනට ඇස්තමේන්තු කිරීමේ අවිනිශ්චිතතාවේ අනාගත සහ අනිකුත් ප්‍රධාන මූලාශ්‍ර සම්බන්ධයෙන් කළමනාකරණය විසින් පහත සඳහන් තීරණ සහ ඇස්තමේන්තු ගෙන ඇත.

අනාගත වැඩිදියුණුකිරීම් සම්බන්ධයෙන් මේ වනවිට පවත්නා තත්ත්වයන් සහ උපකල්පන සමාගමේ පාලනයෙන් එහා ගිය තත්ත්වයන් හේතුකොට ගෙන වෙනස්විය හැකි අතර, එකී වැඩිදියුණු කිරීම් සිදුකරනු ලැබුවහොත් එවන් අවස්ථාවේදී ඒවා ප්‍රත්‍යාවර්තනය කරනු ලැබේ. සැලකිය යුතු කළමනාකරණ තීන්දු සහ/හෝ ඇස්තමේන්තු සමඟ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගනු ලබන ගණන් මත වඩාත් සුවිශේෂී ලෙස බලපාන අයිතම සම්බන්ධයෙන් වන තීන්දු/ ඇස්තමේන්තු සම්බන්ධයෙන් පහත පරිදි විමසා බලනු ලැබේ.

### 2.2.1 අඛණ්ඩභාවය

සමාලෝචිත වර්ෂය තුළ සමාගමට රු. 2,583,053,868/- ක පාඩුවක් සිදුවී ඇති අතර, සමුච්චිත පාඩුව රු. 17,884,556,952/- ක් විය. සමාගමේ වර්තමාන බැරකම්, එහි ජංගම වත්කම් රු. 3,735,588,883/- කින් ඉක්මවා ගොස් ඇත.මෙසේ තිබියදීත්, අවශ්‍ය වුවහොත් සමාගමේ බැඳීම් සපුරාලීම සඳහා මූල්‍යාධාර රාජ්‍ය භාණ්ඩාගාරය විසින් ලබාදෙනු ඇතැයි යන උපකල්පනය මත පිහිටා සමාගමේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩභාවයේ පදනම මත පිළියෙල කර ඇත.

### 2.2.2 ජංගම / ජංගම නොවන වර්ගීකරණය

සමාගමේ වර්තමාන වත්කම් සහ බැරකම් එහි මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ ඉදිරිපත් කරනු ලබන්නේ ජංගම/ජංගම නොවන වර්ගීකරණය පදනම් කරගෙන ය. වත්කමක්, ජංගම වත්කමක් බවට පත්වන්නේ පහත සඳහන් කරුණු සම්පූර්ණ වුවහොත් ය.

- සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ උපලබ්ධිවීමට අපේක්ෂා කරනු ලබන්නේ නම් හෝ විකිණීමට හෝ පරිභෝජනය කිරීමට අදහස් කරන්නේ නම්,
- විකිණීමේ කාර්යය පිණිස මූලික වශයෙන් දරා සිටින්නේ නම්,
- වාර්තා කරනු ලබන කාලසීමාවට පසුව මාස දොළහක් තුළ උපලබ්ධිවීමට අපේක්ෂා කරන්නේ නම් හෝ
- වාර්තා කරනු ලබන කාලසීමාවට පසුව බැරකමක් හිලව් කිරීමට අඩු ගණනේ මාස දොළහක්වත් හුවමාරු කිරීම හෝ භාවිතා කිරීම සීමාකිරීමකින් මිසක මුදල් හෝ මුදල් හා සමාන අයිතම.

අනිකුත් සියලුම වත්කම් වර්ගීකරණය කරනු ලබන්නේ ජංගම නොවන වත්කම් වශයෙනි.

බැරකමක්, ජංගම බැරකමක් වශයෙන් සලකනු ලබන්නේ පහත සඳහන් අවස්ථාවලදී ය.

- එය සාමාන්‍ය මෙහෙයුම් තුළ හිලව් කිරීමට අපේක්ෂා කරන විටෙකදී,
- එය විකිණීමේ කාර්යය පිණිස දරා සිටින විටෙකදී,
- එය වාර්තා කරනු ලබන කාලසීමාවට පසුව මාස දොළහක් ඇතුළත හිලව් කළ යුතුව පවතින විටෙකදී හෝ
- වාර්තා කරනු ලබන කාලසීමාවට පසුව අඩු ගණනනේ මාස දොළහක කාලයක් සඳහා බැරකම හිලව් කිරීමේ කොන්දේසි නොමැති විටෙකදී ය.

අනිකුත් සියලුම බැරකම් සමාගම විසින් ජංගම නොවන බැරකම් ලෙස වර්ගීකරනය කරනු ලැබේ.

### 2.2.3. මූල්‍ය මෙවලම්වල සාධාරණ අගය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරනු ලබන මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම්වල සාධාරණ අගය ක්‍රියාකාරී වෙළඳපොලෙන් ව්‍යුත්පන්න කළ නොහැකි අතර ඒවා ගණිතමය ආදර්ශ භාවිතා කිරීමද ඇතුළුව විවිධ තක්සේරු කිරීමේ ක්‍රම භාවිතා කරමින් නිශ්චය කරනු ලැබේ. මෙකී ආදර්ශ සඳහා යෙදවුම් හැකි අවස්ථාවලදී වෙළඳපොල දත්තවලින් ව්‍යුත්පන්නව නිරීක්ෂණය කරනු ලැබේ. තීන්දු ගැනීම්, වට්ටම් අනුපාත සඳහා ඉක්මනින් වෙනස්වීම වැනි ආදර්ශ යෙදවුම්වලට ඇතුළත් වේ. මූල්‍ය මෙවලම්වල තක්සේරු කිරීම, සටහන් අංක 29 හි වඩාත් සවිස්තරව විස්තර කරනු ලැබේ.

### 2.2.4. මූල්‍ය වත්කම් මත අපහායන පාඩුව

SLFRS 9 යටතේ සියලුම මූල්‍ය වත්කම් කාණ්ඩ හරහා අපහායන පාඩුව මැනීම සඳහා විනිශ්චය විශේෂතා, අනාගත මුදල් ප්‍රවාහ වල ප්‍රමාණය කාලසීමාවන් සහ අපහායන පාඩුව නිර්ණය කිරීමේදී ඇපකර වටිනාකම සහ ණය අවධානම සැලකියුතු වැඩිවීමක් තක්සේරු කිරීම අවශ්‍ය වේ.

## 2.2.5. පාරිභෝගිකයින් සමඟ ගිවිසුම්ගතවීම් වලින් ලද ආදායම

### අ) භාණ්ඩ විකිණීම

භාණ්ඩ විකිණීමෙන් ලද ආදායම හඳුනාගනු ලබන්නේ භාණ්ඩ වල හිමිකාරීත්වයේ සැලකියයුතු අවධානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරු වෙත පැවරී ඇති විටය. එනම් සමාගම් හිමිකාරීත්වය සහ සම්බන්ධන මට්ටමකට අඛන්ඩ කළමනාකරණ මැදිහත්වීමක් හෝ විකුණන ලද භාණ්ඩ කෙරෙහි ඵලදායී පාලනයක් තබා නොගන්නා විටය.

### ආ) පොලී

පොලී ආදායම හඳුනාගනු ලබන්නේ පොලී එකතු කිරීමේ හැකියාව සැක සහිත නම් මිසක උපචිත කරනු ලබන පොලී වශයෙනි.

### ඇ) අනිකුත් ආදායම්

අනිකුත් ආදායම් හඳුනාගනු ලබන්නේ උපචිත පදනම මත ය.

දේපළ, පිරියත සහ උපකරණ සහ අනිකුත් ජංගම නොවන වත්කම් අපහරණය කිරීම මත ආදයම් ස්වභාවයේ ශුද්ධ ඉපයීම් සහ පාඩු, ඒවා අපහරණය කිරීමේදී ලද මුදල, වත්කම්වල ධාරණ අගය සහ අදාල විකුණුම් වියදම් අඩු කොට ආදායම් ප්‍රකාශනයේ ගිණුම්ගත කර ඇත.

ආනුෂංගික ක්‍රියාකාරකම්වල සිට ප්‍රධාන අදායම් උත්පාදන ක්‍රියාකාරකම් දක්වා සහ ද්‍රව්‍යාත්මක නොවන සමාන ගනුදෙනු වර්ගයකින් හටගන්නා ආදායම් සහ පාඩු සමාහාර කිරීම වාර්තා කිරීම සහ ඉදිරිපත් කිරීම ශුද්ධ පදනමක් මත කරනු ලැබේ.

## 2.2.6. දේපළ, පිරියත සහ උපකරණ

### අ) පිරිවැය සහ තක්සේරු කිරීම

දේපළ, පිරියත සහ උපකරණ සඳහන් කරනු ලබන්නේ පිරිවැය, සමුච්චිත ක්ෂය කිරීම හා සමුචිත අපහායන පාඩු වේ. ශුද්ධ අගය සහ යම් සමුච්චිත අපහායන පාඩුවේ පිරිවැය මත ය. එවැනි පිරිවැයට දේපළ, පිරියත සහ උපකරණවල කොටස් ප්‍රතිස්ථාපනය කිරීමට දැරීමට සිදුවූ පිරිවැය සහ හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම් දීර්ඝකාලීන ඉදිකිරීමේ ව්‍යාපෘති සඳහා ණයට ගැනීමේ පිරිවැය ඇතුළත් වේ. දේපළ, පිරියත සහ උපකරණවල සුවිශේෂී කොටස් කාල විරාමයන් තුළ ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍ය වන අවස්ථාවලදී සමාගම විසින් එවැනි කොටස් විශේෂ ප්‍රයෝජ්‍ය ආයු කාලය සහිත තනි වත්කම් ලෙසට හඳුනාගන්නා අතර ඒ අනුව ඒවා ක්ෂය කරනු ලැබේ. එසේම, ප්‍රධාන පරීක්ෂා කිරීමක් සිදුකරනු ලබන අවස්ථාවකදී හඳුනා ගැනීමේ නිර්ණායක සම්බන්ධයෙන්

**සීමාසහිත ලංකා සතොස**
**2019 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

සෑහීමට පත්විය හැකි නම් එහි පිරිවැය, හඳුනාගනු ලබන්නේ දේපල පිරියත උපකරණවල ධාරණ අගයට ප්‍රතිස්ථාපනයක් වශයෙනි. අනිකුත් සියලුම අලුත්වැඩියා සහ නඩත්තු වියදම් ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

අවශේෂ වටිනාකම්, ප්‍රයෝජ්‍ය ආයු කාලයන් සහ දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය කිරීමේ ක්‍රමය ඒ ඒ මූල්‍ය වර්ෂාවසානයේදී සමාලෝචනය කරනු ලබන අතර, අදාළ නම් ගළපනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණ අපහරණය කිරීමේදී හෝ ඒවා භාවිතා කිරීමේදී අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන්නේ නම්, එවැනි දේපළ, පිරියත සහ උපකරණ හඳුනාගනු ගැනීමෙන් වලකිනු ලැබේ. වත්කම හඳුනා නොගැනීම නිසා හටගන්නා යම් ඉපයීමක් හෝ පාඩුවක් (ශුද්ධ අපහරණ මුදල සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණන් බලනු ලැබේ) එකී වත්කම හඳුනාගැනීමෙන් වළකින අවස්ථාවේදී ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.

**ආ) ක්ෂය කිරීම**

ක්ෂය කිරීම් සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ සෘජු-රේඛීය ක්‍රමය භාවිතා කරමින්ය. ක්ෂය කිරීම දේපළ, පිරියත සහ උපකරණවල අනිකුත් සියලුම අයිතමවලට ලබාදෙනු ලබන අතර, එමගින් ඒවායේ අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආර්ථික ආයුකාලය මත ඒවායේ ධාරණ අගයට හිලව් කරනු ලැබේ.

වත්කමකට සංරචක කිහිපයක් තිබෙන්නේ නම් එය වත්කමෙන් භෞතිකව වෙන් කළ හැකි අතර, ඒවාට වෙනස් සුවිශේෂි ප්‍රයෝජ්‍ය ආයු කාලක් ඇත. ඒවා වෙන වෙනම හඳුනාගත යුතු අතර, ඒවායේ අනුපිළිවෙල ප්‍රයෝජ්‍ය ආයු කාලය පදනම් කරගෙන ක්ෂය කළ යුතු ය. සුවිශේෂි සංරචක, ප්‍රධාන වත්කමේ මුළු වටිනාකමින් සුවිශේෂී පිරිවැයක් තිබෙන සංරචක සහ සුවිශේෂී වෙනස් ප්‍රයෝජ්‍ය ආර්ථික ආයු කාලයක් තිබෙන සංරචක මත පදනම් කරගෙන හඳුනාගනු ලැබේ.

ප්‍රයෝජ්‍ය ආයු කාලයන් පහත පරිදි වේ.

| **වත්කම් වර්ගය** | **අනුපාතය** | **අවුරුදු ගණන** |
|---|---|---|
| ගොඩනැගිලි | 5% | 20 |
| ගොඩනැගිලි වෙන් කිරීම | 10% | 10 |
| නාම පුවරු සහ සවිකිරීම | 20% | 5 |
| පරිගණක උපකරණ | 25% | 4 |
| පරිගණක මෘදුකාංග | 25% | 4 |
| උපකරණ | 20% | 5 |
| කාර්යාලීය උපකරණ | 20% | 5 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම | 20% | 5 |
| මෝටර් වාහන | 20% | 5 |
| සන්නිවේදන උපකරණ | 20% | 5 |
| CWE වෙතින් මාරු කළ වත්කම් | 17.5% | 5-6 |

වත්කම් ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය ප්‍රයෝජනයට ගත හැකි අවස්ථාවේ සිට ය.

අවසන් වාර්ෂික වාර්තාකරන දිනයේ සිට සුවිශේෂී වෙනස්වීමක් පෙන්නුම් කරන්නේ නම් වත්කම්වල අවශේෂ වටිනාකම්, ප්‍රයෝජ්‍ය ආයු කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමය සමාලෝචනය කරනු ලැබේ.

### 2.2.7. අස්පෘශ්‍ය වත්කම්

සමාගමේ අස්පෘශ්‍ය වත්කම්වලට පරිගණක මෘදුකාංගවල වටිනාකම, ජාලගත කිරීමට සහ අලෙවි පද්ධතිය ස්ථාපිත කිරීමට අදාල බලපත්‍ර ගාස්තු වටිනාකම ඇතුලත් වේ.

#### අ) හඳුනාගැනීමේ පදනම

අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනු ලබන්නේ එහි පරිව්‍යය විශ්වාසනීය ලෙස ප්‍රමාණය කළ හැකි විටෙකදී සහ අස්පෘශ්‍ය වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත - LKAS 38 හි දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූලවන පරිදි එහි අපේක්ෂිත අනාගත ප්‍රතිලාභ සමාගමට අදාල කරගත හැකිවීමේ සම්භාව්‍යතාවයක් පවතීනම් පමණි.

වෙන වෙනම අත්පත් කරගනු ලැබූ අස්පෘශ්‍ය වත්කම් මූලිකව මිනුම් කරනු ලබන්නේ පිරිවැයටය. ආරම්භක හඳුනාගැනීමෙන් පසුව, අස්පෘශ්‍ය වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සඳහන් කරනු ලබන්නේ පිරිවැයෙන් යම් සමුච්චිත ක්‍රමක්ෂය කිරීමේ පිරිවැය සහ යම් අපහායනය කිරීමේ පාඩුව (එවැනි පාඩුවක් තිබේ නම්) අඩු කිරීමෙනි.

#### ආ) පසුව සිදුවන වියදම්

අස්පෘශ්‍ය වත්කම් සම්බන්ධයෙන් වන පසුව සිදුවන වියදම ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ විශේෂිත වූ වත්කමට අදාල වන්නා වූ අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩිවන විටෙකදී පමණි. දරණ ලද අනෙකුත් සියලු දෑ වියදම් ලෙස සලකනු ලැබේ.

#### ඇ) ඵලදායී ආර්ථික ආයු කාලය, ක්‍රමක්ෂය කිරීම සහ අපහායනය කිරීම

අස්පෘශ්‍ය වත්කම්වල ඵලදායි ආර්ථික ආයු කාලය තක්සේරු කරනු ලබන්නේ නිශ්චිත හෝ අවිනිශ්චිත වශයෙනි. නිශ්චිත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ඒවායේ ප්‍රයෝජ්‍ය ආර්ථික ආයු කාලය මත ක්‍රමක්ෂය කරනු ලැබේ. නිශ්චිත ප්‍රයෝජ්‍ය ආයු කාලයක් සහිත අසපෘශ්‍ය වත්කම් සඳහා ක්‍රමක්ෂය කිරීමේ කාලය සහ ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය අඩු ගණනේ ඒ ඒ වාර්තා කරනු ලබන දිනයේදී හෝ සමාලෝචනය කරනු ලැබේ. වත්කමේ අපේක්ෂිත ආයු කාලය හෝ නිරූපිත අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරීමට අපේක්ෂිත ක්‍රමය යෝග්‍ය පරිදි ක්‍රමක්ෂය කිරීමේ කාලපරිච්ඡේදය හෝ ක්‍රමය වෙනස් කිරීම මගින් ගිණුම්ගත කරනු ලබන අතර, ඒවා ගිණුම් ඇස්තමේන්තුවල වෙනස්වීම් ලෙස සලකනු ලැබේ. නිශ්චිත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීමේ වියදම

**සීමාසහිත ලංකා සතොස**
2019 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

අස්පෘශ්‍ය වත්කමේ කාර්යය සමඟ ගැළපෙන වියදම් වර්ගයට අනුව දැක්වෙන ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.ක්‍රමක්ෂය ගණනය කරනු ලබන්නේ වත්කමේ පිරිවැය ඒවායේ තක්සේරුකර ඵලදායි ආර්ථික ආයුකාලය මත පහත අනුපාතයන් යටතේ අවශේෂ වටිනාකකම් වලට ලියමින් සෘජු-රේඛීය ක්‍රමය භාවිතා කරමිනි.

| වත්කම් වර්ගය | අනුපාතය | අවුරුදු ගණන |
|---|---|---|
| පරිගණක මෘදුකාංග | 25% | 4 |

**ඈ) ශේෂ පත්‍රයෙන් ඉවත්කිරීම**

අස්පෘශ්‍ය වත්කම් ශේෂ පත්‍රයෙන් ඉවත් කරන්නේ ඒවා අපහරණය කරනු ලබන අවස්ථාවේදී හෝ ඒවා භාවිතා කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් නොලැබෙන විටෙකදී ය. වත්කම හඳුනා නොගැනීම හේතුකොට ගෙන හටගන්නා යම් ආදායමක් හෝ පාඩුවක් (වත්කම අපහරණ කිරීමේදී ලැබෙන ශුද්ධ ආදායම සහ එහි ධාරණ අගය අතර වෙනස) එකී වත්කම හඳුනානොගන්නා වසරේ ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

**2.2.8. තොගය**

තොගය තක්සේරු කරනු ලබන්නේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයටය. ශුද්ධ උපලබ්ධි අගය යනු ව්‍යාපාරය සාමාන්‍යයෙන් කරගෙන යන විට එහි ඇස්තමේන්තුගත විකුණුම් මිළෙන් සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීමට අවශ්‍ය කරනු ලබන ඇස්තමේන්තුගත පිරිවැය අඩුකලවිට ලැබෙන අගය වේ.

ඒ ඒ නිෂ්පාදනය පවත්නා ස්ථානයට හා තත්වයට රැගෙන ඒමේදී දැරීමට සිදුවන පිරිවැය සහ තත්ත්වයන් පහත පරිදි ගිණුම්ගත කරනු ලැබේ.

- වෙළඳ භාණ්ඩ - ප්‍රථමයෙන් ලැබෙන ප්‍රථමයෙන් නිකුත් කළ (FIFO) පදනමක් මත සත්‍ය පිරිවැයට
- අනිකුත් තොග ලේඛන - සත්‍ය පිරිවැයට

**2.2.9. වෙළඳ සහ අනිකුත් අයවිය යුතු**

වෙළඳ අයවිය යුතු යනු භාණ්ඩ විකිණීමෙන් සහ ව්‍යාපාරය සාමාන්‍ය පරිදි කරගෙන යාමේදී සේවාවන් ලබාදීම මත පාරිභෝගිකයින්ගෙන් ලැබිය යුතු මුදල් ය. ඒවා ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළදී එකතු කිරීමට අපේක්ෂා කරන (වසරක හෝ ඊට අඩුවෙන්) ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. වෙළඳ ලැබීම් මූලිකව වශයෙන් සාධාරණ අගයට (ඉන්වොයිසියේ දැක්වෙන වටිනාකම) හඳුනාගනු ලබන අතර, පසුව හිඟ මුදල් ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළදී ලැබේ යැයි අපේක්ෂා කරමින් අපහායනය සඳහා කරන ලද ප්‍රතිපාදනයෙන් ඉන්වොයිසියේ දැක්වෙන අගයෙන්

අඩුකොට පසුව ගණනය කරනු ලැබේ.

සෑම වාර්තාකරන දිනයක් අවසානයේදීම වෙළඳ ලැබීමක් අපහානය වී ඇති බවට විශය මූලික සාක්ෂියක් ඇතිත යන්න අගයනු ලබයි. වෙළඳ ලැබිය යුතු සඳහා අපහායනය කිරීමේ අරමුණුගත සාක්ෂිවලට ගෙවීම් එකතු කිරීමේදී ලබාගත් අතීත අත්දැකීම්, ණයගැතියාගේ සුවිශේෂී මූල්‍ය අපහසුතා සහ ණයගැතියා වස්තුභංගත්වයට සහ ගෙවීම් සිදුකිරීමට අපහසුතාවට පත්වීමේ සම්භාවිතාවයන කරුණු ඇතුළත් වේ. වෙළඳ ලැබිය යුතු අපහායනය කරනු ලබන්නේ සහ අපහායනය කිරීමේ පාඩුවක් දරන්නේ අපහානය කිරීමේ අරමුණුගත සාක්ෂියක් තිබේ නම් පමණි. වෙළඳ ලැබිය යුතු දෑ අපහායනය කිරීම සඳහා තනි තනිව තක්සේරු කරනු ලැබේ.

### 2.2.10. මූල්‍ය මෙවලම් - ආරම්භක හඳුනාගැනීම සහ පසුව ඇගයීම්

මූල්‍ය මෙවලමක් යනු එක් අස්තිත්වයක මූල්‍ය වත්කමක් සහ වෙනත් අස්තිත්වයක මූල්‍ය බැරකමක් හෝ ස්කන්ධය මෙවලමක් හටගැනීමට හේතුවන යම් එකඟතාවක් වේ.

### 2.2.11. මූල්‍ය වත්කම්

#### අ) ආරම්භක හඳුනාගැනීම සහ පසුව ඇගයීම

මූල්‍ය වත්කම් මූලික වශයෙන් සාදාරණ අගයට මනිනු ලබන අතර ලාභ හෝ පාඩු තුලින් සාධාරණ අගයක් නොමැති වත්කම් ඇති විට එය ගණුදෙනු පිරිවැයට සෘජුවම සම්බන්ධ කෙරේ.

මූල්‍ය වත්කම් ආරම්භක හඳුනාගැනීමේදී වර්ගීකරණය කිරීම, මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයේ ගතිලක්ෂණ සහ ඒවා කළමනාකරණය කිරීම සඳහා සමාගමේ පවතින ව්‍යාපාරික ආකෘතිය මත රඳා පවතී. සුවිශේෂී මුදල් යෙදවීමේ උපාංගයක් අඩංගු නොවන වෙළඳ ලැබීම් හැර දැමීම හෝ සමාගම විසින් ඒ සඳහා අදාල කරගෙන ඇති ප්‍රායෝගික ක්‍රියාමාර්ගය සමඟ සමාගම විසින් මූල්‍ය වත්කමක් ආරම්භක වශයෙන් අගය කරනු ලබන්නේ එහි සාධාරණ අගයට එකතු වූ යම් හෙයකින් මූල්‍ය වත්කම ලාභ හෝ පාඩු, ගණුදෙනු පිරිවැය ඔස්සේ සාධාරණ අගයේ නොපවතින විටෙකදී ය.

සුවිශේෂී මුදල් යෙදවීමේ උපාංගයක් අඩංගු නොවන වෙළඳ අයවිය යුතු හැර දැමීම හෝ සමාගම විසින් ඒ සඳහා අදාල කරගෙන ඇති ප්‍රායෝගික ක්‍රියාමාර්ගය ප්‍රමාණය කරනු ලබන්නේ ක්‍රමක්ෂය පිරිවැය හෝ අනිකුත් විස්තීර්ණ ආදායම් (OCI) ඔස්සේ සාධාරණ අගය මත වන අතර, එය තනිකරම හිඟව පවතින ප්‍රධාන මුදල මත ප්‍රාග්ධන සහ පොලී ගෙවීම් (SPPI) වන මුදල් ප්‍රවාහ සඳහා හටගැනීමක් අවශ්‍ය වේ. මෙම තක්සේරු කිරීම SPPI පරීක්ෂණය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය නෛතික මට්ටමින් ක්‍රියාවේ යොදවනු ලැබේ. SPPI නොවන මුදල් ප්‍රවාහ සහිත මූල්‍ය වත්කම් ව්‍යාපාරික මොඩලයේ ගණන් නොගන්නා ලාභ හෝ පාඩු ඔස්සේ සාධාරණ අගය මත වර්ගීකරණය කොට ප්‍රමාණය කරනු ලැබේ.

සීමාසහිත ලංකා සතොස
2019 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා සමාගමේ ව්‍යාපාරික ආකෘතියේ හඳුන්වනු ලබන්නේ මුදල් ප්‍රවාහය උත්පාදනය කිරීම පිණිස එහි මූල්‍ය වත්කම් කෙසේ කළමනාකරණය කරන්නේද යනුවෙනි. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කිරීම, මූල්‍ය වත්කම් විකිණීම හෝ ඒ දෙකම සිදුකිරීම මගින් මුදල් ප්‍රවාහයක් සිදුවේද යන්න ව්‍යපාරික ආකෘතිය විසින් තීරණය කරනු ඇත. ක්‍රමක්ෂය පිරිවැය මත වර්ගීකරණය සහ ගණනය කරනු ලබන මූල්‍ය වත්කම් ඒවා සාධරණ අගය මත අනිකුත් විස්තීර්ණ ආදායම් (OCI) ඔස්සේ වර්ගීකරණය සහ ගණනය කරමින් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් එක්රැස් කිරීම පිණිස ඒවා දරා සිටීමේ අරමුණ සහිතව ව්‍යපාරික ආකෘතිය තුළ දරා සිටිනු ලබන්නේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ සහ විකිණීම් යන දෙකම එක්රැස් කිරීම දරා සිටීමේ අරමුණ ඇතිව ය. ව්‍යවස්ථාව හෝ වෙළඳපොළ (ක්‍රමානුකූල වෙළඳ ක්‍රම) සම්මුතිය මගින් පිහිටුවන ලද කාල රාමුවක් තුළ භාරදීමට අවශ්‍ය කරනු ලබන මූල්‍ය වත්කම් මිළදී ගැනීම් හෝ විකිණීම් හඳුනාගනු ලබන්නේ වෙළඳ දිනය එනම් සමාගම විසින් වත්කම් මිළදී ගැනීම හෝ විකිණීම සිදුකරනු ලබන දිනය මත ය.

### ආ) පසුව මිණුම් කිරීම

පසුව මිණුම් ප්‍රමාණය කිරීමේ කාර්යය පිණිස මූල්‍ය වත්කම් පහත පරිදි ප්‍රභේද කරනු ලැබේ.

- ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් (ණය මෙවලම්)
- සමුච්චිත ලාභ සහ පාඩුවල ප්‍රතිචක්‍රීකරණය සහිත අනිකුත් විස්තීර්ණ ප්‍රතිලාභ (OCI) ඔස්සේ සාධාරණ අගයේ මූල්‍ය වත්කම් (ණය මෙවලම්)
- හඳුනා නොගැනීම මත සමුච්චිත ලාභ සහ පාඩුවල ප්‍රතිචක්‍රීකරණයක් රහිතව අනිකුත් විස්තීර්ණ ප්‍රතිලාභ (OCI) ඔස්සේ සාධාරණ අගයේ නම් කරනු ලබන මූල්‍ය වත්කම්
- ලාභ හෝ පාඩු ඔස්සේ සාධාරණ අගයේ මූල්‍ය වත්කම්

### ඇ) ශේෂපත්‍රයෙන් ඉවත්කිරීම්

මූල්‍ය වත්කමක් (හෝ, අදාල අවස්ථාවලදී, මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) මූලිකවම හඳුනා නොගන්නේ (එනම්, සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් ඉවත් කරනු ලබන්නේ)

- වත්කමෙන් මුදල් ප්‍රවාහය ලැබීමේ අයිතීන් සහිත කාලය ඉකුත්වී ඇති,

  හෝ
- වත්කමෙන් මුදල් ප්‍රවාහය ලැබීමට සමාගමට තිබෙන අයිතීන් සමාගම විසින් මාරු කර ඇති හෝ ලැබූ මුදල් ප්‍රවාහයන් ද්‍රව්‍යාත්මක ප්‍රමාදයකින් තොරව තුන්වන පාර්ශවයකට විනිවිද යන (pass-hrough) විධිවිධානයක් යටතේ සම්පූර්ණයෙන් ගෙවීමට තිබෙන බැඳීමක් උපකල්පනය කර ඇති, හෝ (අ) වත්කමේ සියලුම අවදානම් සහ ප්‍රතිඵල හරවත්ව මාරු කර ඇති, හෝ

(ආ) වත්කමේ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සමාගම විසින් හරවත්ව මාරු කර හෝ රඳවානොගෙන, එහෙත් වත්කමේ පාලනය මාරු කර ඇති විටෙකදී ය.

මාරු කරන ලද වත්කමක් මත වගකීමක් ඇති කිරීමට මැදිහත්වීම අඛණ්ඩව පවත්වාගෙන යාම ගණනය කරනු ලබන්නේ වත්කමේ මුල් ධාරණ අගය සහ සමාගම විසින් නැවත ගෙවීමට සිදුවන ප්‍රතිෂ්ඨාවේ උපරිම අගය යන දෙකෙන් අඩු වටිනාකමටය.

### ආ) අපහායනය කිරීම

ලාභ හෝ පාඩු ඔස්සේ සාධාරණ අගයේ දරා නොසිටින සියලුම ණය මෙවලම් වල අපේක්ෂිත ණය අහිමිවීම් (ECLs) සඳහා සමාගම විසින් වෙන් කිරීමක් හඳුනා ගනී. ණය අහිමිවීම් (ECLs) පදනම් කරගනු ලබන්නේ කොන්ත්‍රාත්තුවට අනුව හිඟව පවතින මුදල් ප්‍රවාහ සහ සමාගමට ලැබීමට අපේක්ෂා කරන සියලුම මුදල් ප්‍රවාහ අතර වෙනස මත වන අතර, එලදායී පොලී අනුපාතය මත වට්ටම් කරනු ලබයි. අපේෂිත මුදල් ප්‍රවාහයන්ට ඇපකර විකිණීමෙන් ලැබෙන මුදල් හෝ ගිවිසුම්ගත නියමන්ට අනුගත ණය ඉහල දැමීමෙන් වන මුදල් ප්‍රවාහයන් ඇතුලත් වේ.

### මූල්‍ය බැරකම්

### අ) ආරම්භක හඳුනා ගැනීම සහ ගණනය කිරීම

මූල්‍ය බැරකම් ආරම්භක වශයෙන් හඳුනා ගැනීමේදී වර්ගීකරණය කරනු ලබන්නේ සාධාරණ අගයේ මූල්‍ය බැරකම්, ණය සහ ණයට ගැනීම්, ගෙවිය යුතු දෑ හෝ එලදායි ඉදිරි රැකුමක ඉදිරි රැකුම් මෙවලම් වශයෙන් අදාල පරිදි නම් කරනු ලැබූ ව්‍යුත්පන්න ලෙස ය. සියලුම මූල්‍ය බැරකම් ආරම්භක වශයෙන් හඳුනාගනු ලබන්නේ සාධාරණ අගය මත වන අතර, ණය සහ ණයට ගැනීම් සහ ගෙවිය යුතු දෑ සෘජුවම ශුද්ධ ගණුදෙනු පිරිවැයට අගය කරනු ලබයි. සමාගමේ මූල්‍ය බැරකම්වලට වෙළඳ සහ අනිකුත් ගෙවිය යුතු දෑ, බැංකු අයිරා ඇතුළු ණය සහ ණයට ගැනීම්, සහ ව්‍යුත්පන්න මූල්‍ය මෙවලම් ඇතුලත් වේ.

### ආ) පසුව මැනුම් කිරීම

පසුව මැනුම් කිරීමේ කාර්යය පිණිස මූල්‍ය බැරකම් ප්‍රභේද දෙකකට වර්ගීකරණය කරනු ලැබේ.

- ලාභ හෝ පාඩු ඔස්සේ සාධාරණ අගයේ මූල්‍ය බැරකම්
- ක්‍රමක්ෂය කිරීමේ පිරිවැය මත මූලය බැරකම් (ණය සහ ණයට ගැනීම්)

### ඇ) ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම

මූල්‍ය බැරකමක් හඳුනා නොගනු ලබන්නේ බැරකම යටතේ වන බැඳීම නිදහස් කරනු ලබන, අවලංගු කරනු ලබන හෝ එහි කාලය ඉකුත්වී ඇති අවස්ථාවකදී ය. පවත්නා මූල්‍ය බැරකමක් එකම ණය හිමිකරු විසින් සැකිය යුතු වෙනස්කම් සහිතව හෝ පවතින වෙනත් මූල්‍ය බැරකමක් මගින් වාස්තවික ලෙස වෙනස් නියමයන් හෝ වාස්තවික ලෙස වෙනස් කරන ලද දේ නම් එසේ හුවමාරු කිරීම හෝ වෙනස් කිරීම මුල් බැරකමක් ඉවත් කිරීම සහ නව බැරකමක් හඳුනාගැනීමක් ලෙස සලකනු ලැබේ. අදාල ධාරණ අගයන්හි වෙනස ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

### මූල්‍ය උපකරණ හිලව් කිරීම

මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් හිලව් කරනු ලබන අතර, හඳුනා ගත් වටිනාකම් හිලව් කිරීමට පොදුවේ බලාත්මක කළ හැකි නෛතික අයිතිවාසිකමක් තිබේ නම් සහ වත්කම් උපලබ්ධි කිරීමට සහ බැරකම් එක විටම ශුද්ධ පදනම මත හිලව් කිරීමේ අදහසක් තිබේ නම් ශුද්ධ අගය ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තාගත කරනු ලැබේ.

### 2.2.12. මුදල් සහ කෙටි කාලීන තැන්පතු

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සඳහන් මුදල් සහ කෙටිකාලීන තැන්පතු වලට බැංකුවේ තිබෙන සහ අත ඇති මුදල් සහ කෙටි කාලීන ඉහල ද්‍රවශීලතාවක් ඇති කල්පිරීමේ කාලය මාස 03 හෝ ඊට අඩු ඉක්මනින් හා අඩු අවදානමකින් මුදල් බවට පරිවර්ථනය කල හැකි තැන්පතු වේ.

ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාර්යය පිණිස මුදල් සහ මුදල් සමාන දෑ යන්න මුදල් සහ කෙටි කාලීන තැන්පතුවලින් සහ ඉහත අර්ථ දක්වා ඇති පරිදි සමාගමේ මුදල් කළමනාකරණයේ අඛණ්ඩ කොටසක් ලෙස සලකනු ලබන හිඟව පවතින බැංකු අයිරාවල ශුද්ධ අගය යන අයිතමවලින් සමන්විත වේ.

### 2.2.13. සේවක විශ්‍රාම ප්‍රතිලාභ

### අ) නිශ්චිත දායකත්ව සැලසුම් පිරිවැය

නිශ්චිත දායකත්ව සැලසුම යනු යම් අස්ථිත්‍යයක් විසින් වෙන් වූ අසථිත්‍යයකට ස්ථිර දායකත්ව මුදල් ගෙවීම යටතේ ක්‍රියාත්මක වන පශ්චාත්-සේවක ප්‍රතිලාභ සැලසුමක් වන අතර තවදුරටත් ගෙවීම් සිදුකිරීමේ නෛතික හෝ අනුමිත බැඳීමක් නොපවතිනු ඇත. නිශ්චිත දායකත්ව සැලසුමක් සඳහා දායකත්ව මුදල් ගෙවීමට ඇති බැඳීම්, සේවකයින් සේවය කර ඇති කාලපරිච්ඡේදයන් තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ලාභ හෝ පාඩු කොටසේ පෞද්ගලික වියදම් ලෙසට හඳුනා ගනු ලැබේ. අදාල ආඥාපනත් සහ ව්‍යවස්ථා ප්‍රකාරව සේවකයින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයින්ගේ භාර අරමුදලට සුදුසුකම් ලබති. ඒ අනුව, සේවකයින්ගේ දළ වැටුපෙන් 12% ක සහ 3%

ක ප්‍රමාණයක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයින්ගේ භාර අරමුදලට දායක මුදල් ලංකා සතොස ලිමිටඩ් සමාගම විසින් ගෙවනු ලබන අතර, එය පෞද්ගලික වියදම් යටතේ හඳුනාගනු ලැබේ.

### ආ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් යනු නිශ්චිත දායකත්ව සැලසුමක් නොවන පශ්චාත්-සේවක ප්‍රතිලාභ සැලසුමකි. නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් සම්බන්ධයෙන් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ හඳුනාගනු ලබන බැරකම යනු වාර්තා කරනු ලබන දිනට නිශ්චිත ප්‍රතිලාභ බැරකමේ වර්තමාන අගය වේ. නිශ්චිත ප්‍රතිලාභ බැරකම ගණනය කරනු ලබන්නේ ව්‍යාපෘති ඒකක ණය ක්‍රමය (Projected Unit Credit Method) භාවිතා කිරීමෙන් ය.

නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගය නිශ්චය කරනු ලබන්නේ ප්‍රතිලාභ ගෙවනු ලබන වලංගු මුදලේ නාමනය කරනු ලබන පොලී අනුපාත භාවිතා කරමින් සහ බැරකමේ නියමයන්ට කල් පිරීමට තිබෙන නියමයන් භාවිත කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කරමිනි. සියලුම සේවකයින්ගේ පළමු සේවා වර්ෂයේ සිට විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 19 ට (LKAS 19) අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත.

කෙසේ වෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනතට අනුව, සේවකයෙක් සඳහා ගෙවීමට ඇති බැඳීම හටගන්නේ අවුරුදු 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කළහොත් පමණි. බැරකම සඳහා බාහිරින් අරමුදල් සපයනු ලබන්නේ නැත.

### 2.2.14. රජයෙන් ලැබෙන ප්‍රදානයන්

රජයෙන් ලැබෙන ප්‍රදානයන් හඳුනාගනු ලබන්නේ එකී ප්‍රදානයන් ලැබුණු බවට සාධාරණව සහතිකවී සහ ඊට සම්බන්ධිත සියලුම කොන්දේසිවලට අනුකූලවී ඇති අවස්ථාවකදී ය. ප්‍රදානය, වියදම් අයිතමයකට අදාල වන අවස්ථාවකදී එය ක්‍රමානුකූල පදනමක් මත පිරිවැය අදාල වන කාලපරිඡේදය මත කිනම් හානිපූරණයක් සඳහා වියදම් කිරීමට අදහස් කරන්නේද මත ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ. ප්‍රදානය වත්කමකට අදාල වන අවස්ථාවකදී, එය අදාල වත්කමේ අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයුකාලය මත සමාන ගණන්වලින් ආදයමක් ලෙසට හඳුනාගනු ලැබේ.

සමාගමට ප්‍රදානයන් වශයෙන් මුදල් නොවන වත්කම් ලැබෙන අවස්ථාවලදී එකී වත්කම් සහ ප්‍රදානයන් නාම මාත්‍ර ගණන්වලින් වාර්තාගත කරනු ලබන අතර පාදක වූ වත්කමේ ප්‍රතිලාභ පරිභෝජනය කරනු ලබන ආකාරය පදනම් කරගෙන සමාන වාර්ෂික වාරිකවලින් අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයුකාලය මත ලාභ හෝ පාඩු ලෙසට නිදහස් කරනු ලැබේ.

### 2.2.15. සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

මුදලක් අයකර ඇත්ද යන්න නොසලකා එක් පාර්ශවයක මූල්‍ය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති/තීරණ මත වන සුවිශේෂී බලපෑම පාලනය කිරීමේ හෝ යෙදවීමේ අනෙක් පාර්ශවයකට හැකියාව තිබෙන ගනුදෙනු සම්බන්ධයෙන් අනාවරණය කිරීම් සිදුකර ඇත.

### 2.2.16. වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදයට පසු අවස්ථා

වාර්තා කරනු ලබන කාලපරිඡේදය අවසානයට පසුව වන සියලුම ද්‍රව්‍යාත්මක අවස්ථා සැලකිල්ලට ගෙන ඇති අතර යෝග්‍ය ගැළපීම්/අනාවරණය කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් දක්වා ඇත.

### 2.2.17. බදු අය කිරීම

#### අ) වර්තමාන ආදායම් බදු

වර්තමාන සහ පෙර කාලපරිඡේද සඳහා ජංගම ආදායම් බදු වත්කම් සහ බැරකම් ප්‍රමාණය ගණනය කරනු ලබන්නේ බදු අධිකාරීන්ගෙන් අයකර ගැනීමට හෝ බදු අධිකාරීන්ට ගෙවීමට අපේක්ෂිත මුදල මත ය. මුදල ගණනය කිරීමට භාවිතා කරනු ලබන බදු අනුපාත සහ බදු නීති වන්නේ වාර්තා කරනු ලබන දිනට පනවා ඇති හෝ හරවත්ව පනවනු ලබන බදු අනුපාත සහ බදු නීති වේ.

ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම් වන්නේ මූල්‍ය ප්‍රකාශනවල වාර්තාගත කර ඇති පරිදි ආදායම් සහ වියදම් මූලිකාංග මත වන අතර අදාල බදු නීති සම්පාදනයට අනුකූලව ගණනය කරනු ලැබේ.

සම කොටස්වල සෘජුවම හඳුනාගනු ලබන අයිතමවලට අදාල ජංගම ආදායම් බදු හඳුනාගනු ලබන්නේ ආදායම් ප්‍රකාශනයේ නොව සම කොටස්වල ය.

#### ආ) විලම්බිත බදු අය කිරීම

වත්කම් හා වගකීම් වල බදු පදනමට සහ මූල්‍ය ප්‍රකාශන වල ධාරක අතර පැන නගින තාවකාලික වෙනස්කම් මත විලම්භිත බදු හඳුනා ගැනේ. විලම්බිත බදු බැරකම් හඳුනාගනු ලබන්නේ බදු අයකළ හැකි සියලුම තාවකාලික වෙනස්කම් සඳහා ය.

විලම්බිත ආදයම් බදු වත්කම්, අඩු කළ හැකි සියලුම තාවකාලික වෙනස්කම් සඳහා හඳුනාගනු ලබන අතර පාවිච්චි නොකරන ලද බදු වත්කම් සහ පාවිච්චි නොකරන ලද බදු අහිමිවීම් ඉදිරියට රැගෙන යාම, බදු අය කල හැකි ලාභය, අඩු කළ හැකි තාවකාලික වෙනස්කම්වලට එදිරිව තිබිය හැකි සසම්භාවී ප්‍රමාණයට, සහ භාවිතා නොකරන ලද බදු වත්කම් සහ භාවිතා නොකරන ලද බදු අහිමිවීම් ඉදිරියට ගෙන යාම උපයෝජනය කළ හැකි ය.

**සීමාසහිත ලංකා සතොස**
**2019 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

විලම්බිත ආදායම් බදු වත්කම්වල ධාරණ අගය ඒ ඒ වාර්තා කරනු ලබන දිනට සමාලෝචනය කරනු ලබන අතර, උපයෝජනය කළ යුතු විලම්බිත ආදයම් බදු වත්කම්වල සියලුම කොටස්වල ඉඩදීමට ප්‍රමාණවත් බදු අය කළ හැකි ලාභය තිබීම තවදුරටත් සසම්භාවී නොවන ප්‍රමාණයට අඩු කරනු ලැබේ.

විලම්බිත ආදායම් බදු වත්කම් සහ බැරකම්, වාර්තා කරනු ලබන දිනට පනවා ඇති හෝ හරවත්ව පනවනු ලබන බදු අනුපාත සහ බදු නීති පදනම් කරගෙන වත්කම උපලබ්ධි කරනු ලබන හෝ බැරකම හිලව් කරනු ලබන වර්ෂයට අදාල කිරීමට අපේක්ෂා කරන බදු අනුපාත මත ගණනය කරනු ලැබේ.

සම කොටස්වලදී සෘජුවම හඳුනාගනු ලබන අයිතමවලට අදාල විලම්බිත ආදායම් බදු හඳුනා ගන්නේ ආදායම් ප්‍රකාශනයේ නොව සම කොටස්වලදී ය.

**ඈ) විකුණුම් බදු**

ආදායම්, වියදම් සහ වත්කම් පහත සඳහන් අවස්ථාවලදී හැර විකුණුම් බදුවල ශුද්ධ අගයේදී හඳුනා ගනු ලැබේ.

අ) වත්කම් මිළට ගැනීමක් හෝ සේවාවන් මත දැරීමට සිදුවූ විකුණුම් බදු, බදු අය කරනු ලබන අධිකාරීන් වෙතින් අය කර ගත නොහැකි වනවිට එවැනි අවස්ථාවලදී විකුණුම් බදු හඳුනා ගනු ලබන්නේ අදාල පරිදි වත්කම අත්පත් කර ගැනීමේ පිරිවැයේ කොටසක් හෝ වියදම දරනු ලැබූ අයිතමයේ කොටසක් වශයෙනි.

ආ) අයවිය යුතු හා ගෙවිය යුතු දෑ සඳහන් කරනු ලබන්නේ විකුණුම් බදු ඇතුළත් කරනු ලැබූ මුදල සමඟ ය.

ඇ) බදු අය කරනු ලබන අධිකාරියෙන් අයකර ගත හැකි හෝ එම අධිකාරියට ගෙවිය යුතු විකුණුම් බදුවල ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අයවිය යුතු හෝ ගෙවිය යුතු දෑ හි කොටසක් ලෙස ඇතුළත් කරනු ලැබේ.

## 2.3. ගිණුම් ප්‍රතිපත්ති සහ අනාවරණය කිරීම්වල වෙනස්කම්

### 2.3.1. නව සහ සංශෝධිත ප්‍රමිත සහ අර්ථ විග්‍රහ කිරීම්

මෙම මූල්‍ය ප්‍රකාශන සඳහා සමාගම විසින් SLFRS 16 - කල්බදු අදාල කරගෙන ඇත. මෙම නව ගිණුම් ප්‍රමිත යොදා ගැනීමේ ප්‍රතිඵල ලෙස බලපෑමේ සහ වෙනස්කම්වල ස්වභාවය, සටහන් අංක 2.3.1.1 හි විස්තර කරනු ලැබේ.

### 2.3.1.1. SLFRS 16 – කල්බදු

SLFRS 16 මගින් LKAS 17- ‘කල්බදු’ හා IFRIC 4 – 2019 ජනවාරි 01 වෙනි දිනට හෝ ඊට පසුව කාලපරිච්ඡේද සඳහා ‘විධිවිධානයක කල්බද්දක් අන්තර්ගත වන්නේද යන්න නිශ්චය කිරීම.

මෙම ප්‍රමිතය මගින් කල්බදු හඳුනා ගැනීම, ගණනය කිරීම, ඉදිරිපත් කිරීම, කල්බදුවල ඉදිරිපත් කිරීම සහ අනාවරණය කිරීම සඳහා මූල්‍ය ධර්ම හඳුන්වා දී ඇති අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ බදුගැනුම්කරුවන් විසින් බොහෝ කල්බදු හඳුනා ගැනීමට අවශ්‍ය කෙරේ.

ලංකා සතොස ලිමිටඩ්
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකශන සඳහා සටහන්

| | | සටහන | 2019 | 2018 |
|---|---|---|---|---|
| 3. | **ආදායම** | | | |
| 3.1 | **ස්වයංක්‍රීය වෙලඳසැල්වල ආදායම** | | | |
| | සිල්ලර නිෂ්පාදන | | 3,248,671,505 | 3,073,912,768 |
| | කුළුබඩු | | 4,696,093,981 | 5,558,012,954 |
| | මත්පැන් | | 2,219,292,568 | 529,424,002 |
| | ප්‍රවර්ධන | | 442,539,029 | 933,020,117 |
| | ගෘහභාණ්ඩ අයිතම | | 402,019,812 | 395,484,931 |
| | ලිපි ද්‍රව්‍ය | | 3,765,184 | 3,365,926 |
| | | | 11,012,382,080 | 10,493,220,698 |
| 3.2 | **ස්වයංක්‍රීය නොවන ආදායම** | | 15,073,176,416 | 18,769,851,088 |
| | දළ ආදායම | | **26,085,558,496** | **29,263,071,786** |
| | (අඩු කළා) | | (96,633,818) | (97,164,224) |
| | | | (24,049,155) | - |
| | **ශුද්ධ ආදයම** | | **25,964,875,523** | **29,165,907,562** |

3.3 ස්වයංක්‍රීය නොවන වෙළඳසැල්වල ආදායම විකුණන ලද අයිතම ප්‍රකාරව වර්ගීකරණය කළ නොහැකිය. එසේ නමුත් විකුණන ලද භාණ්ඩ සඳහා සමස්ථ ලැබීම් අත්පිට විකුණුම්, කාඩ්පත් මගින් සිදුකරනු ලබන විකිණීම්, තෑගි වවුචර්පත් මගින් සිදුකරනු ලබන විකිණීම් සහ ණයට සිදුකරනු ලබන විකිණීම් යන සියල්ලෙන්ම සමන්විත වේ.

| | | 2019 | 2018 |
|---|---|---|---|
| 4. | **විකුණුම් පිරිවැය** | | |
| | ආරම්භක තොගය | 4,462,675,947 | 4,295,373,354 |
| | මිළදී ගැනීම් හා වෙනත් | 22,861,357,333 | 26,056,753,039 |
| | | 27,324,033,280 | 30,352,126,393 |
| | (අඩු කළා)මිළදී ගැනීම් ආපසු යැවීම | (501,112,131) | (109,295,223) |
| | අවසාන තොගය | (4,050,649,263) | (4,462,675,947) |
| | | 22,965,552,031 | 25,780,155,223 |
| | තොග හානි (සටහන 5.) | 193,280,144 | 271,125,743 |
| | | **23,158,832,176** | **26,051,280,966** |

| | | 2019 | 2018 |
|---|---|---|---|
| 5. | **හානි සහ වෙනත් තොග ගැලපුම්** | 193,280,144 | 271,125,743 |
| | | **193,280,144** | **271,125,743** |

5.1 තොග හානි, සාමාන්‍ය පාඩු සහ අසාමාන්‍ය පාඩු නියෝජනය කරයි. සාමාන්‍ය අලාභ ප්‍රවාහනයේ සිදුවන අලාභ, වෙළඳසැලේ සිදුවන සොරකම් වැනි පාඩු නියෝජනය කරයි. අනෙක් අතට, අසාමාන්‍ය අලාභයන් නියෝජනය කරන්නේ සොරකම් සහ වංචාවෙන් සිදුවන පාඩු වන අතර ඒවා අයකර ගතයුතු නමුත් නීතිමය අතින් අපහසුතා පවතී. LSL 100% පරිගණක ගත කර නොමැති අතර එම කාල සීමාව තුළ අලෙවිසැල් වලින් 2/3 ක් අතින් ක්‍රියාත්මක වේ. එම නිසා පාඩු සාමාන්‍ය හෝ අසාමාන්‍ය ලෙස හඳුනා ගැනීමට හැකියාවක් නැත.

ලංකා සතොස ලිමිටඩ්
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකශන සඳහා සටහන්

| | | සටහන | 2019 | 2018 |
|---|---|---|---|---|
| 6. | වෙනත් ආදායම් | | | |
| | ගොන්ඩෝලා ආදායම | | 123,788,756 | 115,647,117 |
| | විකුණුම් ප්‍රවර්ධන | | 84,447,127 | 32,764,852 |
| | එළවලු කොමිස් ආදායම් | | 2,315,256 | 3,100,722 |
| | විවිධ ආදායම් | | 13,571,314 | 13,514,111 |
| | ප්‍රවාහන ආදායම් | | 179,172,495 | 211,560,469 |
| | ලියාපදිංචි සහ ලැයිස්තු ගාස්තු අදායම් | | 9,432,666 | 86,614,416 |
| | Creditor Write Back | | 25,140,468 | - |
| | කුළී අදායම් | | 4,171,500 | 2,531,374 |
| | දඩ ආදායම් | | 11,805,315 | 5,180,021 |
| | ඒකාබද්ධ ව්‍යාපාර සැලසුම් ආදායම් | | 4,830,000 | 13,930,000 |
| | විලම්බිත ආදායම් ක්‍රමක්ෂය කිරීම - ප්‍රාග්ධන ප්‍රදානයන් | | 560,669,096 | 395,241,390 |
| | අදායම් අයකර ගැනීම් | | 22,386,977 | 15,853,998 |
| | | | 1,041,730,971 | 895,938,470 |
| 7. | මූල්‍ය ආදායම් | | | |
| | ස්ථාවර තැන්පතුවලින් පොළී ආදායම් | | 100,892,068 | 96,167,991 |
| | | | 100,892,068 | 96,167,991 |
| 8. | මූල්‍ය පිරිවැය | | | |
| | ණය සහ ණයට දීම් නිසා පොළී වියදම් | | 1,404,100,086 | 1,029,034,724 |
| | බැංකු අයිරා නිසා පොළී වියදම් | | 60,771,393 | 10,101,369 |
| | | | 1,464,871,479 | 1,039,136,093 |

ලංකා සතොස ලිමිටඩ්
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකශන සඳහා සටහන්

| | සටහන | 2019 | 2018 |
|---|---|---|---|

9. ආදායම් බදු

මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සදහා ආදායම් බදුවල ප්‍රධාන අංග පහත පරිදි වේ.

| | 2019 | 2018 |
|---|---|---|
| **වර්තමාන ආදායම් බදු** | | |
| වර්තමාන ආදායම් බදු අයකිරීම් (සටහන 15.1) | (815,494,328) | (815,311,369) |
| පෙර වර්ෂවල බදුවල අඩි ප්‍රතිපාදන | - | - |
| | (815,494,328) | (815,311,369) |
| **විලම්බිත ආදායම් බදු** | | |
| වර්ෂය සඳහා ලාභයේ විලම්බිත බදු අයකිරීම/(ප්‍රත්‍යාවර්තනය) (සටහන15.2) | - | - |
| **ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ වාර්තා කර ඇති ආදායම් බදු වියදම්** | **(815,494,328)** | **(815,311,369)** |

9.1 වර්තමාන බදු වියදම සහ ව්‍යවස්ථාපිත බදු අනුපාතයෙන් වැඩිකරනු ලැබූ ගිණුම් ලාභය අතර සැඳීමක් පහත පරිදි වේ.

| | 2019 | 2018 |
|---|---|---|
| බදුවලට පෙර ගිණුම් ලාභය/(පාඩුව) | (3,158,544,037) | (2,888,463,273) |
| අඩුකළ නොහැකි වියදම් | 641,643,350 | 752,029,474 |
| අඩුකළ හැකි වියදම් | (395,579,058) | (775,392,518) |
| බදු ගෙවිය යුතු ලාභය | (2,912,479,744) | (2,911,826,316) |
| ව්‍යවස්ථාපිත බදු අනුපාතය | 28% | 28% |
| වර්තමාන ආදයම් බදු වියදම | **(815,494,328)** | **(815,311,369)** |

## ලංකා සතොස ලිමිටඩ්
## 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
## මූල්‍ය ප්‍රකශන සඳහා සටහන්

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)

10. දේපළ, පිරියත සහ උපකරණ

10.1 දළ ධාරණ වටිනාකම

| | 2019.01.01 දිනට ශේෂය | එකතුකිරීම් | මාරු කිරීම් | ප්‍රත්‍යාගණනය කිරීම | බැහැරකිරීම්/ මාරු කිරීම | 2019.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| පිරිවැයේදී | 444,100,663 | 20 | | 6,231,285 | | 450,331,968 |
| ගොඩනැගිලි | 190,371,871 | 31,458,917 | | (43,797,477) | | 178,033,312 |
| නාම පුවරු සවිකිරීම් | 228,812,039 | 25,512,756 | | (20,001,208) | | 234,323,586 |
| පරිගණක උපකරණ | 314,003,281 | 34,058,763 | | (87,600,644) | | 260,461,399 |
| පරිගණක මෘදුකාංග | 1,567,752,874 | 217,216,075 | 50,393,893 | (91,684,108) | | 1,743,678,734 |
| උපකරණ | 352,356,749 | 30,176 | - | (7,894) | | 352,379,031 |
| කාර්යාලීය උපකරණ | 284,261,402 | 4,314,149 | - | (11,230,125) | | 277,345,426 |
| ගෘහභාණ්ඩ සහ උපකරණ | 18,821,440 | | | | | 18,821,440 |
| මෝටර් වාහන | 3,642,602 | - | - | - | - | 3,642,602 |
| සන්නිවේදන උපකරණ | 22,798,843 | - | - | - | - | 22,798,843 |
| CWE හි වත්කම් | 3,426,921,764 | 312,590,835 | 50,393,893 | (248,090,171) | - | 3,541,816,341 |
| වැඩ කෙරෙමින් පවතින | | | | | | |
| ඉදිකිරීම් | 107,329,535 | - | (90,996,739) | - | (16,332,796) | - |
| | 107,329,535 | - | (90,996,739) | - | (16,332,796) | - |
| මුළු දළ ධාරණ වටිනාකම | **3,534,251,299** | **312,590,835** | **(40,602,846)** | | **(16,332,796)** | **3,541,816,341** |

10.2 ක්ෂය කිරීම්

| | 2019.01.01 දිනට ශේෂය | මාරු කිරීම් | බැහැරකිරීම්/ මාරු කිරීම | 2019.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| පිරිවැයේදී | | | | |
| ගොඩනැගිලි | 106,030,749 | 23,513,338 | (3,843,028) | 125,701,059 |
| නාම පුවරු සවිකිරීම් | 121,280,658 | 40,599,764 | (110,877,546) | 51,002,875 |
| පරිගණක උපකරණ | 223,014,144 | 22,762,604 | (93,250,534) | 152,526,214 |
| පරිගණක මෘදුකාංග | 143,051,812 | 51,725,761 | (105,517,147) | 89,260,425 |
| උපකරණ | 580,893,049 | 300,549,784 | (470,953,643) | 410,489,190 |
| කාර්යාලීය උපකරණ | 352,284,835 | 36,674 | (97,318) | 352,224,192 |
| ගෘහභාණ්ඩ සහ උපකරණ | 268,663,679 | 10,333,733 | (20,883,986) | 258,113,426 |
| මෝටර් වාහන | 18,821,440 | - | - | 18,821,440 |
| සන්නිවේදන උපකරණ | 3,642,602 | - | - | 3,642,602 |
| CWE හි වත්කම් | 22,798,843 | - | - | 22,798,843 |
| මුළු ක්ෂය කිරීම් | **1,840,481,811** | **449,521,657** | **(805,423,202)** | **1,484,580,266** |

ලංකා සතොස ලිමිටඩ්
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකශන සඳහා සටහන්

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)

| | සටහන | 2019 | 2018 |
|---|---|---|---|

10. දේපළ, පිරියත සහ උපකරණ (තවදුරටත්)

10.3 ශුද්ධ පොත් අගය

| | 2019 | 2018 |
|---|---|---|
| **පිරිවැයේදී** | | |
| ගොඩනැගිලි | 324,630,910 | 338,069,914 |
| නාම පුවරු සවිකිරීම් | 127,030,436 | 69,091,213 |
| පරිගණක උපකරණ | 81,797,372 | 5,797,895 |
| පරිගණක මෘදුකාංග | 171,200,974 | 170,951,469 |
| උපකරණ | 1,333,189,544 | 986,859,825 |
| කාර්යාලීය උපකරණ | 154,839 | 71,914 |
| ගෘහභාණ්ඩ සහ උපකරණ | 19,232,000 | 15,597,723 |
| මෝටර් රථ | - | - |
| සන්නිවේදන උපකරණ | - | - |
| CWE හි වත්කම් | - | - |
| | 2,057,236,075 | 1,586,439,955 |
| ඉදිකිරීම් සිදු කිරීමේදී | | |
| සිදුකෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ | - | 107,329,535 |
| | - | 107,329,535 |
| **දේපළ, පිරියත සහ උපකරණවල මුළු ධාරණ වටිනාකම** | **2,057,236,075** | **1,693,769,490** |

10.4 මූල්‍ය වර්ෂය තුළ සමාගම විසින් ශ්‍රී ලංකා රු. 312,590,835/- ක (2018 - ශ්‍රී ලංකා රු. 850,781,800/-) සමාහාර අගයක් සහිත දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගනු ලැබීය. වර්ෂය තුළ දේපළ, පිරියත සහ උපකරණ මිළදී ගැනීම සඳහා ශ්‍රී ලංකා රු. 288,408,585/ ක් (2018 - ශ්‍රී ලංකා රු. 428,609,735/-) ක් මුදලින් වැයකර ඇත.

10.5 දේපළ. පිරියත සහ උපකරණවලට ශ්‍රී ලංකා රු. 1,428,787/-ක (2018 – ශ්‍රී ලංකා රු. 89,257/-) දළ ධාරණ වටිනාකමක් සහිත සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් ඇතුළත් ය.

11. අස්පෘශ්‍ය වත්කම්

| | | පරිගනක මෘදුකාංග | එකතුව |
|---|---|---|---|
| 11.1 | **පිරිවැය** | | |
| | 2019 ජනවාරි 01 දිනට | 48,783,135 | 48,783,135 |
| | වර්ෂය තුළ අත්පත් කරනු/ දරණු ලැබූ | 50,099,999 | 50,099,999 |
| | WIP වෙතින් මාරු කරනු ලැබූ | 40,602,846 | - |
| | වර්ෂය තුළ අස් කරන/ අපහරණය කරන ලද | - | - |
| | 2019 දෙසැම්බර් 31 දිනට | 139,485,981 | 98,883,135 |
| 11.2 | **ක්‍රමක්ෂය කිරීම/ අඩු කිරීම** | | |
| | 2019 ජනවාරි 01 දිනට | 43,169,128 | 43,169,128 |
| | වර්ෂය සඳහා ක්‍රමක්ෂය කිරීම/ අඩු කිරීම | 23,771,221 | 23,771,221 |
| | 2019 දෙසැම්බර් 31 දිනට | 66,940,349 | 66,940,349 |
| 11.3 | **ශුද්ධ පොත් අගය** | | |
| | 2018 අප්‍රේල් 01 දිනට | 5,614,007 | 5,614,007 |
| | **2019 මාර්තු 31 දිනට** | 72,545,632 | 72,545,632 |

11.4 **ERP පද්ධතිය**

අස්පෘශ්‍ය වත්කම්වලට ලංකා සතොස ලිමිටඩ්හි භාවිතය සඳහා අත්පත් කරගනු ලැබූ මෙහෙයුම් පද්ධති මෘදුකාංග, මානව සම්පත් ආශ්‍රිත මෘදුකාංග සහ උපයෝගිතා මෘදුකාංග සඳහා දරනු ලැබූ පිරිවැය ඇතුළත් වේ. ඒවා එකී මෘදුකාංග අත්පත් කරගනු ලැබූ වර්ෂයෙන් ආරම්භවී වසර 4 ක් පුරා එක සමානව ක්‍රමක්ෂය කර ඇත.

ලංකා සතොස ලිමිටඩ්
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකශන සඳහා සටහන්

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)

| | සටහන | 2019 | 2018 |
|---|---|---|---|
| **12. තොග** | | | |
| වෙළඳ තොග (කුළුබඩු අයිතම) | | 859,525,910 | 722,660,136 |
| වෙළඳ තොග (සිල්ලර අයිතම) | | 3,047,217,017 | 3,620,995,483 |
| වෙළඳ තොග (මධ්‍යසාර) | | 143,906,335 | 119,020,328 |
| | | **4,050,649,263** | **4,462,675,947** |
| **13. වෙළඳ සහ වෙනත් ලැබීම්** | | | |
| සාරාංශය | | | |
| වෙළඳ ලැබීම් (සටහන 13.1) | | 312,964,207 | 237,624,919 |
| අදාල පාර්ශවයන්ගේ ලැබිය යුතු මුදල (සටහන 13.1) | | - | - |
| අනිකුත් ලැබිය යුතු (සටහන 13.3) | | 224,199,951 | 418,481,809 |
| | | **537,164,158** | **656,106,728** |
| **13.1 වෙළඳ ලැබිය යුතු දෑ** | | | |
| ණයපත් / හරපත් පාලනය | | 16,826,673 | 18,750,974 |
| වෙළඳ අයවිය යුතු - වෙළඳ ලැබීම් / ණය පාලනය | | 245,842,904 | 153,944,880 |
| අඩුකළා අපහායන සඳහා වෙන් කිරීම | | (62,959,958) | (62,959,958) |
| | | 199,709,619 | 109,735,896 |
| ලැබිය යුතු ගොන්ඩෝලා ආදායම | | 4,999,231 | 6,683,193 |
| අඩුකළා අපහායන සඳහා වෙන් කිරීම | | (92,000) | (92,000) |
| | | 204,616,849 | 116,327,089 |
| ගිණුම් අයවිය යුතු | | 108,347,358 | 121,297,830 |
| | | **312,964,207** | **237,624,919** |
| **13.2 අදාල පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල්** | **සම්බන්ධතාවය** | | |
| සමුපකාර තොග වෙළඳ සංස්ථාව | අදාල සමාගම | 10,083,353 | 10,083,353 |
| | | (10,083,353) | (10,083,353) |
| | | - | - |
| **13.3 අනිකුත් අයවිය යුතු** | | | |
| කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය | | 214,333,982 | 407,453,631 |
| ක්‍රීඩා අමාත්‍යාංශය | | 36,453,533 | 36,453,533 |
| අඩුකළා අපහායනය සඳහා වෙන් කිරීම | | (38,723,533) | (36,453,533) |
| | | 212,063,981 | 407,453,631 |
| අනිකුත් අයවිය යුතු - නිකුත් කරන ලද තෑගි වවුචර් | | 12,135,969 | 10,740,016 |
| චෙක්පත් පාලනය /අලෙවිසැල් පාලනය | | - | 288,162 |
| | | **224,199,951** | **418,481,809** |

ලංකා සතොස ලිමිටඩ්
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකශන සඳහා සටහන්

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)

| | සටහන | 2019 | 2018 |
|---|---|---|---|

**14. තැන්පතු සහ අත්තිකාරම්**

| | | |
|---|---|---|
| කුළී අත්තිකාරම් | 138,241,607 | 209,351,445 |
| කුළී තැන්පතු | 5,532,120 | 5,532,121 |
| කුළී පෙර ගෙවීම් | 154,725 | 128,840 |
| උත්සව අත්තිකාරම් (සටහන 14.1) | 5,355,312 | 3,083,999 |
| අත්තිකාරම් - වෙනත් අත්තිකාරම් | 3,761,308 | 51,602,016 |
| ආනයන නිශ්කාසන අත්තිකාරම් - ලිවර්පූල් නැව්ගේෂන් (සටහන 14.2) | - | - |
| නැවත අයවිය යුතු තැන්පතු | 1,754,044 | 1,898,706 |
| ගමන්බිමන් අත්තිකාරම් | 923,658 | 1,093,829 |
| ප්‍රේෂණ (සටහන 14.3) | 17,881,160 | 16,824,788 |
| | **173,603,934** | **289,515,740** |

**14.1 උත්සව අත්තිකාරම්**

| | | |
|---|---|---|
| වර්ෂය ආරම්භයේදී ශේෂය | 3,529,999 | 2,079,431 |
| වර්ෂය තුළ ප්‍රදානය කරන ලද ණය | 54,498,750 | 2,417,500 |
| අඩුකළා : වර්ෂය තුළ ආපසු ගෙවීම් | (52,227,438) | (966,932) |
| වර්ෂය අවසානයේදී ශේෂය | 5,801,312 | 3,529,999 |
| අඩුකළා : අපහායන සඳහා වෙන්කිරීම | (446,000) | (446,000) |
| | **5,355,312** | **3,083,999** |

**14.2 ආනයන නිශ්කාසන අත්තිකාරම් - ලිවර්පූල් නැව්ගේෂන්**

| | | |
|---|---|---|
| ආනයන නිශ්කාසන අත්තිකාරම් | 267,600,500 | 267,600,500 |
| අඩුකළා : අපහායන කිරීම සඳහා දීමනා | (267,600,500) | (267,600,500) |
| | - | - |

**14.2.1 ඉහත මුදල, 2015 සහ 2016 වර්ෂවලදී ලිවර්පූල් නැව්ගේෂන් සමාගමට සහ ආනයනික සහල් නිශ්කාසනයට ගෙවන ලද මුදල් නියෝජනය කරයි.**

**14.3 ප්‍රේෂණ**

| | | |
|---|---|---|
| ප්‍රේෂණ (සටහන 14.4.1) | 74,643,497 | 73,587,125 |
| අපහායන කිරීම සඳහා ප්‍රතිපාදන | (56,762,337) | (56,762,337) |
| | **17,881,160** | **16,824,788** |

14.4.1 මෙම ලැබිය යුතු මුදල ස්වයංක්‍රීය නොවන අලෙවිසැල් හරහා සිදුකල විකුණුම්වලින් වියදම් කල මුදල නිරූපණය කරයි.

ලංකා සතොස ලිමිටඩ්
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකශන සඳහා සටහන්

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)

| | | සටහන | 2019 | 2018 |
|---|---|---|---|---|
| 15. | **පෙර ගෙවීම් වියදම් සහ ව්‍යවස්ථාපිත ලැබීම්** | | | |
| | පෙර ගෙවීම් වියදම් (සටහන 15.1) | | 9,357,323 | 6,380,284 |
| | ව්‍යවස්ථාපිත ලැබීම් (සටහන 15.2) | | 4,689,377 | - |
| | | | **14,046,701** | **6,380,284** |
| 15.1 | **පෙර ගෙවීම් වියදම්** | | | |
| | රක්ෂණ | | 7,634,559 | 6,217,764 |
| | EWIS බලපත්‍ර සහ නඩත්තු | | 1,722,764 | 22,520 |
| | මධ්‍යසාර බලපත්‍ර | | - | 140,000 |
| | | | **9,357,323** | **6,380,284** |
| 15.2 | **ව්‍යවස්ථාපිත අයවිය යුතු** | | | |
| | ආදායම් බදු | | 8,922,123 | 10,927,534 |
| | රඳවාගැනීමේ බදු (ආරම්භක) | | 8,700,198 | 2,005,410 |
| | අඩුකළා : අපහායන කිරීම | | (12,932,944) | (12,932,944) |
| | | | **4,689,377** | - |
| 16. | **මුදල් හා මුදල් සමාන දෑ** | | | |
| | මුදල් හා මුදල් සමාන දෑ සඳහා අංග | | | |
| 16.1 | **හිතකර මුදල් හා, මුදල් හා මුදල් සමාන ශේෂය** | | | |
| | REPO හි කෙටිකාලීන අයෝජන (සටහන 16.1.1) | | - | 72,807,479 |
| | බැංකුවේ තිබෙන මුදල් (සටහන 16.1.2) | | 42,357,184 | 47,909,008 |
| | අත ඇති මුදල් (සටහන 16.1.3) | | 189,745,214 | 192,240,074 |
| | කෙටිකාලීන තැන්පතු | | 876,182,253 | 869,873,055 |
| | | | **1,108,284,651** | **1,182,829,616** |

16.1.1 **REPO හි කෙටිකාලීන අයෝජන (සටහන 16.1.1)**

මෙම ආයෝජනයට සීමාසහිත ලංකා සතොස සමාගම විසින් ගිණුම් අංක 004-1-004-6-1991855 න් දිනපතා පදනම යටතේ ආයෝජනය කරන ලද අතිරේක මුදල් ශේෂයන් ඇතුළත් වේ.

| | | | 2019 | 2018 |
|---|---|---|---|---|
| 16.1.2 | **බැංකවේ තිබෙන මුදල්** | | | |
| | මහජන බැංකුව | | 7,183,743 | 13,814,722 |
| | ඉතිරි කිරීමේ ගිණුම | 004-2-002-6-1991855 | 58,600 | 58,600 |
| | මාස්ටර් කාඩ් ගිණුම | 004-1-001-1-0000044 | 10,782,285 | 12,526,840 |
| | මධ්‍යසාර ගිණුම | 004-1-002-8-1991855 | - | 3,239 |
| | උපයෝගිතා ගිණුම | 004-2-007-3-1991855 | 7,919,016 | 5,389,719 |
| | වෙළඳ ගිණුම | 004-1-004-6-1991855 | 353,198 | 715,009 |
| | මොබිටෙල් ගිණුම | 004-2-006-4-1991855 | 29,505 | 29,505 |
| | ඩයලොග් ගිණුම | 004-2-005-5-1991855 | | |
| | ලංකා බැංකුව | | 1,103,894 | 1,103,894 |
| | ජංගම ගිණුම | 76587128 | | |
| | නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | | 14,926,942 | 4,715,613 |
| | කාඩ්පත් ගිණුම | 100060011036 | | |
| | කොමර්ෂල් බැංකුව | | - | 9,551,867 |
| | කාඩ්පත් ගිණුම | 1480045950 | **42,357,184** | **47,909,008** |
| 16.1.3 | **අත්පිට මුදල්** | | | |
| | | | 3,540,755 | 3,250,755 |
| | මුදල් සංචිත | | 4,200,331 | 51,750 |
| | විශේෂ සුළු මුදල් | | 6,917,559 | 6,903,753 |
| | සුළු මුදල්සංචිත | | 175,086,569 | 182,033,816 |
| | අලෙවිසැල් මුදල් පාලනය | | **189,745,214** | **192,240,074** |

16.1.3.1 **වෙළඳසැල් මුදල් පාලනය**

මෙම ශේෂයට වර්ෂය අවසානයේදී තනි තනි වෙළඳසැල් විසින් එකතු කරන ලද තැන්පත් නොකරන ලද මුදල් ඇතුළත්ය.

ලංකා සතොස ලිමිටඩ්
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකශන සඳහා සටහන්

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)

| | | සටහන | 2019 | 2018 |
|---|---|---|---|---|
| 16. | මුදල් හා මුදල් සමාන (තවදුරටත්...) | | | |
| | **අවාසිදායක මුදල් හා මුදල් සමාන ශේෂය** | | | |
| | බංකු අයිරා (සටහන 16.1) | | | |
| | සුළු මුදල් ගිණුම | 004-1-003-7-1991855 | (1,884,406) | (52,910) |
| | ප්‍රධාන ජංගම ගිණුම | 004-1-001-9-1991855 | (824,098,167) | (877,021,303) |
| | උපයෝගිතා ගිණුම | 004-2-007-3-1991855 | (12,172,649) | - |
| | | | (838,155,222) | (877,074,213) |
| | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සඳහන් මුදල් හා මුදල් සමාන දෑ | | **270,129,429** | **305,755,403** |

| | | 2019 | | 2018 | |
|---|---|---|---|---|---|
| 17. | ප්‍රකාශිත ප්‍රාග්ධනය | | | | |
| | සම්පූර්ණයෙන් ගෙවන ලද සාමාන්‍ය කොටස් | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම |
| 17.1 | **සම්පූර්ණයෙන් ගෙවන ලද සාමාන්‍ය කොටස්** | 89,375,272 | 893,752,720 | 89,375,272 | 893,752,720 |
| | | **89,375,272** | **893,752,720** | **89,375,272** | **893,752,720** |

| | | පොලී අනුපාතය | 2019 | 2018 |
|---|---|---|---|---|
| 18. | **පොළී ධාරක ණය සහ ණයට ගැනීම්** | | | |
| 18.1 | **ජංගම පොළී ධාරක ණය සහ ණයට ගැනීම්** | පොලී අනුපාතය | | |
| | ආනයන ණය (සටහන 18.2.1) | පාවෙන අනුපාතය | - | - |
| | කාරක ප්‍රාග්ධන ණය (සටහන 18.2.2) | පාවෙන අනුපාතය | 600,000,000 | 614,895,507 |
| | බැංකු අයිරා | පාවෙන / ස්ථිර | 838,155,222 | 877,074,213 |
| | | | **1,438,155,222** | **1,491,969,720** |
| 18.2 | **ජංගම නොවන පොළී ධාරක ණය සහ ණයට ගැනීම්** | | | |
| | ආනයන ණය (සටහන 18.2.1) | | 11,478,530,743 | 10,485,627,819 |
| | කාරක ප්‍රාග්ධන ණය (සටහන 18.2.2) | | 2,400,000,000 | 1,301,000,000 |
| | | | **13,878,530,743** | **11,786,627,819** |
| 18.2.1 | **ආනයන ණය** | | | |
| | ආරම්භක ශේෂය | | 10,485,627,819 | 9,865,785,205 |
| | වර්ෂය තුළ ලබාගත් | | - | - |
| | පොළී උපචිත | | 992,902,924 | 619,842,614 |
| | අඩුකළා : ආපසු ගෙවීම් | | | - |
| | | | **11,478,530,743** | **10,485,627,819** |
| 18.2.2 | **කාරක ප්‍රාග්ධන ණය** | | | |
| | ආරම්භක ශේෂය | | 1,915,895,507 | 2,568,443,836 |
| | වර්ෂය තුළ ලබාගත් | | 3,000,000,000 | - |
| | පොළී උපචිත | | - | 14,895,507 |
| | අඩුකළා : ආපසු ගෙවීම් - ප්‍රාග්ධන | | (1,901,000,000) | (18,443,836) |
| | ආපසු ගෙවීම් - පොළී | | (14,895,507) | (649,000,000) |
| | | | **3,000,000,000** | **1,915,895,507** |

ලංකා සතොස ලිමිටඩ්
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකශන සඳහා සටහන්

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)

| | සටහන | 2019 | 2018 |
|---|---|---|---|
| **19. පශ්චාත් සේවානියුක්ති ප්‍රතිලාභ බැරකම්** | | | |
| ප්‍රතිලාභ බැඳීම - පාරිතෝෂික | | | |
| වර්ෂය ආම්භයේදී ශේෂය | | 199,029,270 | 130,447,129 |
| වර්ෂය සඳහා අයකිරීම (සටහන 19.1) | | 37,719,902 | 74,488,748 |
| වර්ෂය තුළ කරන ලද ගෙවීම් | | (8,283,358) | (5,906,607) |
| වර්ෂය අවසානයේදී ශේෂය | | **228,465,814** | **199,029,270** |
| **19.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම මත වියදම** | | | |
| වර්තමාන සේවා පිරිවැය | | 30,453,252 | 28,364,710 |
| ප්‍රතිලාභ බැඳීම මත පොළී පිරිවැය | | 23,883,513 | 15,653,655 |
| ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ හඳුනාගත් | | 54,336,765 | 44,018,365 |
| අනිකුත් විස්තීර්ණ ආදයම්වල හඳුනාගත් සත්‍ය (ආදායම්)/පාඩු | | (16,616,863) | 30,470,383 |
| | | **37,719,902** | **74,488,748** |

